# ඌව දැන් ඉස්සර තරම් දුප්පත් නෑ:

# දරිද්‍රතා පරතර දර්ශකයේ යහපත් වෙනසක්

**බදුල්ල දිස්ත්‍රික් සමූහ**
**ජයසේන විජේනායක**

ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ දත්ත අනුව ඌව පළාතේ දරිද්‍රතාව මේ වනවිට සැලකිය යුතු ලෙස පහළ ගොස් තිබෙන අතර 2012 වර්ෂයේ ඌව පළාතේ එක්ලක්ෂ අනූදහසක් වූ දුප්පත් ජනගහනය 2016 වසර වනවිට අනූතුන්දහස් අටසිය අසූපහක් දක්වා අඩුවී තිබේ. 2012 වර්ෂයේ සියයට දෙකයි දශම හයක්ව තිබූ දරිද්‍රතා පරතර දර්ශකය 2016 වර්ෂයේදී සියට බින්දුවයි දශම හතක් දක්වා අඩුවී තිබෙන බව ඌව මහ අමැති චාමර සම්පත් දසනායක මහතා පැවසීය.

2016 වර්ෂයේදී හතරයි දශම හයක්ව පැවති ඌව පළාතේ සේවා වියුක්තිය 2017 වසරේදී සියයට තුනයි දශම පහ දක්වා සියයට එකයි දශම එකකින් අඩුවී තිබීම සැලකිය යුතු ප්‍රගතියක් ලෙස සඳහන් කළ හැකි යැයි පැවසූ මහ ඇමැතිවරයා, 2018 වර්ෂයේ දත්ත තිල සංඛ්‍යා ලේඛන ආකාරයට මෙතෙක් ප්‍රකාශයට පත්වී නොමැති වුවත් ඉහත කරුණු අනුව ඌව පළාත පසුගිය කාලය තුළ සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගැනීම සතුටට කරුණක් බවත් කීය.

මේ තත්ත්වයෙන් පෙන්නුම් කරන්නේ ධනාත්මක ප්‍රවණතාවක් බව පෙන්වාදෙන ඌව මහ ඇමැති චාමර සම්පත් දසනායක මහතා වැඩිදුරටත් කියා සිටියේ මෙම පරතරය ක්‍රමයෙන් අඩුවීම තුළින් පෙන්නුම් කරන්නේ ඌව පළාතේ දුප්පත්කම අඩුවීම බවත් මෙම ලක්ෂණය දිගටම පැවතුනහොත් 2020 – 2025 අතර කාලය තුළ ශ්‍රී ලංකාවේ ඒකපුද්ගල දළ දේශීය නිෂ්පාදිතය ඉක්මවීමට ඌව පළාතට හැකියාව ලැබෙන බවයි.

2016 වර්ෂයේ ඒකපුද්ගල දළ දේශීය නිෂ්පාදිත දත්ත සැලකීමේදී ඌව පළාතේ ඒකපුද්ගල දළ දේශීය නිෂ්පාදිතය ශ්‍රී ලංකාවේ ඒකපුද්ගල දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව රුපියල් හතළිස් තුන්දහසකින් පමණ අඩු අගයක් පෙන්නුම් කරනවා. එසේ වුවත් පෙර වර්ෂ හා සැසඳීමේදී මේ තත්ත්වයෙන් පෙන්නුම් කරන්නේ ධනාත්මක ප්‍රවණතාවක් යැයි ද මහ ඇමැතිවරයා වැඩිදුරටත් සඳහන් කළේය.